(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 6(2).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 මැයි මස 26 වැනි සිකුරාදා**

---

**2017 ජුනි මස 06 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 21 දිනැති අංක 2011/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2017 ජූලි මස 04 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

921/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 ජනවාරි සිට 2015 ජනවාරි දක්වා කාලය තුළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදුවී ඇති වංචා, දූෂණ සහ රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමෙන් පරීක්ෂණ පවත්වනු ලබන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම වංචා හා දූෂණවලට අමාත්‍යාංශ නිලධාරින් සම්බන්ධ බවට හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012 අංක 21 දරන පළාත් පාලන මැතිවරණ පනත ප්‍රකාරව, පළාත් පාලන කොට්ඨාස මායිම් පිළිබඳ අභියාචනා සලකා බැලීමට අභියාචනා කමිටුවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුව විසින් 2016 ඔක්තෝබර් 31 දිනට අභියාචනා සලකා බලා අවසන් කර ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(iv) එම පළාත් පාලන ආයතන සඳහා මෙතෙක් මැතිවරණ නොපැවැත්වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1162/'16

ගරු බිමල් රත්නායක මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හක්වටුනාව සහ කහල්ල රක්ෂිත යෝජිත අලිමංකඩ සැලැස්ම සකස් කර ඇත්තේ වනජීවී කළමනාකරණ කමිටුවක් මඟින් නම්, එහි සාමාජිකයන්ගේ නම්, ලිපින හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) ඒ පිළිබඳව ක්ෂේත්‍ර අධ්‍යයනයක් කර තිබේ නම්, ඒ කවර කාලයේද; අදාළ වනජීවී කළමනාකරණ කමිටුව හමු වූ ආගමික සහ ප්‍රජා සංවිධාන කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් පරිසර අධ්‍යයනයක් කර තිබේ නම්, ඊට සහභාගී වූ පරිසර සංවිධාන/පරිසරවේදීන් කවුරුන්ද;

(iv) එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි සැලැස්මක් සකස් කළ යුතු විද්‍යාත්මක ක්‍රමවේදය කවරේද; යෝජිත සැලැස්ම සකස්කර ඇත්තේ එම ක්‍රමවේදයට අනුවද;

(ii) යෝජිත අලිමංකඩ සැලැස්ම ගජ-මිතුරු සංවිධානය අනුමත කරන ලද්දේ නම්, ඒ කවර කාලයේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සැලැස්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තාවකාලිකව අත්හිටුවා තිබියදී එය නොතකා ප්‍රාදේශීය ලේකම්වරයා ඒ පිළිබඳව මැදිහත්වීම් කරන බවත්;

(ii) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අභිබවා යෑමට ප්‍රාදේශීය ලේකම්වරයාට බලය පවරා තිබේ නම්, ඒ කවුරුන් විසින්ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1181/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වව්නියාව දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1297/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් ශ්‍රේණිධාරී විදුහල්පතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික හෝ පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරින් නොවන පුද්ගලයන් විදුහල්පති ධූරයන් දරන්නේද;

(iv) එසේ නම්, එම පාසල් කවරේද;

(v) විදුහල්පති ශ්‍රේණියක් ලබා ඇති මුත්, විදුහල්පති ධූරයක් නොලබා මාතර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල්වල සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත (v) සඳහා හඳුනාගත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1311/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මගින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, නිල අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

(iii) කල්මුනේ ද්‍රවිඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ උප ලේකම් කොට්ඨාසයක් පිහිටුවා තිබේද;

(iv) එසේ නම්, එයට අදාළ ගැසට් පත්‍රය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය කාලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද සුළු පරිමාණ සංවර්ධන යෝජනා, ඇස්තමේන්තුගත මුදලට අදාළ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සමිති සමාගම්වලට කොන්ත්‍රාත් ප්‍රදානය කළ බව පිළිගන්නේද;

(ii) එසේ වුවද, වර්තමානයේ ඉහත කී සංවර්ධන යෝජනා සඳහා ටෙන්ඩර් කැඳවා අඩුම ටෙන්ඩරයට එම කොන්ත්‍රාත් පිරිනමනු ලබන බව දන්නේද;

(iii) එසේ ටෙන්ඩර් කැඳවා අඩුම ටෙන්ඩරයට එම සංවර්ධන යෝජනා කොන්ත්‍රාත් පිරිනැමීම නිසා ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ සමිති සමාගම්වලට එම කොන්ත්‍රාත් ලබා ගැනීමට නොහැකි වීමෙන් එකී සමිතිවලටද ප්‍රදේශයටද ප්‍රතිලාභ අහිමිවී ඇති බව පිළිගන්නේද;

(iv) ඉහත කී සමිතිවලට සිදුවී ඇති අසාධාරණයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහා පෙර තිබූ පරිදි විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තොරව සුළු පරිමාණ කොන්ත්‍රාත් ඇස්තමේන්තුගත මුදලට එම සමිතිවලට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1330/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් (LTL) සමාගමෙහි උප සමාගමක් ලෙස LTL ප්‍රොජෙක්ට්ස් සමාගම පිහිටවූ දිනය කවරේද;

(ii) LTL සමාගමට එහි 100% ක අයිතිය තිබේද;

(iii) එහි වර්තමාන අයිතිකරුවන් කවුරුන්ද;

(iv) මේ වනවිට LTL සමාගමට LTL ප්‍රොජෙක්ට්ස් සමාගමේ කොටස් හිමිවී තිබේද;

(v) LTL සමාගම සතු LTL ප්‍රොජෙක්ට්ස් සමාගමෙහි කොටස් අන්සතු කිරීමට හෝ පැවරීමට අයිතියක් ලබා දුන්නේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) LTL සමාගමට අයත් සී/ස LTL ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) නමැති උප සමාගම 2006 න් පසු විගණන වාර්තාවන්ට ඇතුළත් වී නොමැති බවත්; ඒ හේතුවෙන් මෙම සමාගමේ ලාභාංශ රජයට නොලැබෙන බවත් එතුමා දන්නේද;

(ii) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර 2006 වසරේ සිට මේ දක්වා රජයට අහිමි වූ ලාභාංශ මුදල් ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1344/'16

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එරාවූර් නගර සභාව, කාත්තන්කුඩි නගර සභාව සහ කෝරළපත්තුව බටහිර ප්‍රාදේශීය සභාව යන තෝරා පත් කරන ලද පළාත් පාලන ආයතන විසුරුවා හළ දින සිට එනම්, 2015 මැයි 15 සිට මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියමිත සේවක මණ්ඩල ප්‍රතිපාදනවලින් බැහැරව එම ආයතනවලට කරන ලද අතිරේක තාවකාලික සේවක පත්කිරීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නැගෙනහිර පළාතේ වත්මන් ප්‍රධාන අමාත්‍යාවරයාගේ නිර්දේශ මත කරන ලද එවැනි පත්කිරීම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පත්කිරීම් වෙනුවෙන් පාරිශ්‍රමික ගෙවීමට ප්‍රමාණවත් අරමුදල් ඒ ඒ පළාත් පාලන ආයතන සතුව තිබේද;

(iv) එම තාවකාලික සේවකයන් විසින් ඉටු කෙරෙන සේවාවන්වල ස්වභාවය කෙබඳුද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පත්කිරීම් එක් එක් පළාත් පාලන ආයතනයේ අවශ්‍යතා සමඟ අනුකූල වන්නේද;

(ii) එමඟින් කාර්ය මණ්ඩල අතිරික්තයක් හා මූල්‍ය අවහිරතාවයක් ඇති වී තිබේද; එසේ නම්, ඒ මන්ද;

(iii) එවැනි කවර හෝ තාවකාලික සේවකයන්ට අඩු වැටුප් ගෙවීම හෝ වැටුප් නොගෙවීම සිදුවේද; එසේ නම්, ඒ මන්ද;

(iv) මෙම තාවකාලික සේවකයන් අන්තර්ග්‍රහණය කර ගැනීම පිණිස නියමිත සේවක සංඛ්‍යා ප්‍රතිපාදන වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1370/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනාවන්ට අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය විධිමත් කිරීමට අවශ්‍ය "නියාමන අධිකාරියක්" පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදී රු. 25,000/-ක ගාස්තුවක් ගෙවිය යුතුද;

(iv) සුළු හා මධ්‍ය පරිමාණ අංශය මුහුණ දෙන ගැටලු අධ්‍යයන කිරීම සඳහා උපදේශක කමිටුවක් පිහිටවනු ලැබුවේද;

(v) එසේ නම්, එම කමිටුවෙහි සාමාජිකයන් කවුරුන්ද;

(vi) සුළු හා මධ්‍ය පරිමාණ ණය ආරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේදී, රුපියල් මිලියන 500 ක මූලික අරමුදලක් රජය මඟින් ලබා දුන්නේද;

(vii) සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයට සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් සැපයීමට ආධාරයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 100ක ණය පහසුකමක් ලැබුණේද;

(viii) ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ, ණය ලබා දුන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නම් හා ලිපිනයන් ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1472/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ,

(i) සමෘද්ධි සහනාධාර ලබා ගන්නා පවුල් සංඛ්‍යාව;

(ii) දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන පවුල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන සහ සමෘද්ධි සහනාධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇතත්, සහනාධාර නොලැබෙන ජනතාවට සමෘද්ධි සහනාධාර ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත අලුතින් ගොඩනැගිල්ලක් ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වූ පුද්ගලයන් සහ ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල සඳහා රජයේ තක්සේරුව; අයිතිකරුගේ නම හා ලිපිනය; මාසික කුලිය සහ ගෙවූ අත්තිකාරම් මුදල කවරේද;

(vi) එම ගොඩනැගිල්ල සඳහා අයිතිකරු සමඟ අත්සන් කළ බදු ගිවිසුම සභාගත කරන්නේද;

(vii) කෘෂිකර්ම අමාත්‍යාංශය එම ගොඩනැගිල්ල වෙත ගෙන ගිය දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1047/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.10 සිට 2016.10.31 දක්වා කාල පරිච්ඡේදයේදී විදේශ කටයුතු අමාත්‍යවරයා සහභාගි වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් සංචාරයේ අරමුණ, සංචාරය කරන ලද රට සහ එක් එක් සංචාරයට වැය වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී සංචාරයන්හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය යහපත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1184/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1331/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට (LTL Holdings (Pvt.) Ltd) අයත් උප සමාගම් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම උප සමාගම් පිහිටුවීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම එක් එක් සමාගමෙන් කෙරෙන කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත සමාගම්වල ආදායමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන ලාභ කොටසේ ප්‍රතිශතය, එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ලාභ කොටස් නිවැරදි නොවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ජූලි මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1066/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සකසන ලද 2015 – 2020 ක්‍රියාකාරි සැලැස්මෙහි දුම්රිය එංජින් මිලදී ගැනීමට විධිවිධාන සලසා නොමැති වීමට හේතුව කවරේද;

(ii) එකී සැලැස්ම ක්‍රියාත්මක නොකරන්නේ නම්, විකල්ප සැලැස්මක් සකසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරි මිල කැඳවීමකින් තොරව ඉන්දියාවෙන් දුම්රිය එංජින් මිලදී ගැනීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ඉන්දියාවේ දුම්රිය එංජින් නිෂ්පාදනය කරන සමාගම්වල නම් කවරේද;

(iv) ජාත්‍යන්තර තරඟකාරි මිල ගණන් නොකැඳවීම යහපාලන මූලධර්මයට එකඟද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1137/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට පුරා ක්‍රියාත්මක දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සභාපති හෝ සම සභාපති ධුර දරන පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයන් අතරින් පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරයන් නොවන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1185/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1299/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ජාතික හා පළාත්,

(i) පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පාසල්වල සේවය කරන ගුරුවරු සංඛ්‍යාව එක් එක් පාසල අනුව;

(iii) පාසල්වල සේවය කරන ගුරුවරු සංඛ්‍යාව එක් එක් විෂය අනුව;

(iv) පාසල්වල සේවය කරන ගුරුවරු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කලාපය අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල් තුළ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ජාතික හා පළාත් පාසල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශිෂ්‍යයන් සහ ගුරුවරුන් අතර අනුපාතය, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් අනුපාතය අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1332/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් නමින් ආයතනයක් තිබුනේද;

(ii) එම ආයතනයේ නම වෙනස් කර තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන නම කවරේද;

(iv) සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් කොටස් බෙදී ගොස් ඇත්තේ කෙසේද;

(v) ESOT (භාරය) කොටස්කරුවන් සතුව ඇති කොටස් පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එහි කොටස්කරුවන්ගේ නම් හා ඔවුන් සතුව ඇති කොටස් සංඛ්‍යාව පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(vii) සේවකභාර ගිවිසුම් අනුව, එය පිහිටුවා කොපමණ කාලයක් ඇතුළත ඔවුන්ගේ කොටස් පිළිබඳව හා ඔවුන් කොටස්කරුවන් බව දන්වා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ESOT සමාගමෙහි ආරම්භක කොටස්කරුවන් කවුරුන්ද, ඔවුන් සතුව තිබූ කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම කොටස්කරුවන් අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඔහුට ලබැදියාව පිළිබඳව පිළිගැටුම තිබෙන බව එතුමා පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) COPE වාර්තාවේ සඳහන් පරිදි සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමෙන් රුපියල් දස ලක්ෂ 232 ක ලාභාංශ ප්‍රමාණයක් ලංකා විදුලිබල මණ්ඩලයට නොගෙවා තිබෙන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1373/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 126 යෝජනාවට අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ අලෙවි ප්‍රවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳසැල්වල රාක්ක ඉඩකඩ සාධාරණ මිලකට ලබා දෙනු ලැබුවේද;

(ii) පෞද්ගලික අංශයේ සුපිරි වෙළඳ සැල්වලින් එකී රාක්ක ඉඩකඩ වෙන් කර දෙන ලෙසට කිසියම් අමාත්‍යාංශයක් විසින් ඉල්ලීමක් කරනු ලැබුවේද;

(iii) එසේ ඉල්ලීමක් හෝ නියෝගයක් කරනු ලැබුවේ නම්, එහි පිටපතක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාව තුළ පිහිටි බදු අය කරනු ලබන පෞද්ගලික අංශයෙහි සුපිරි වෙළඳසැල් සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති නගර/ග්‍රාමයන් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1473/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රට තුළ ක්‍රියාත්මක, රටේ සංවර්ධන කාර්යයට සුවිශේෂී දායකත්වයක් දක්වන ප්‍රාදේශීය මාධ්‍යවේදී සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රාදේශීය මාධ්‍යවේදී සංවිධානවල නම් හා එහි නිලතල දරන මාධ්‍යවේදීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට මෙන්ම වෘත්තීය ජීවිතයේ අභිවෘද්ධිය උදෙසා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1499/’16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 23 වගන්තියට අනුව, වයස අවුරුදු 12 න් පහළ මුස්ලිම් දැරියන් විවාහ කර දීමේදී ක්වාසි විනිසුරුවරයන්ගේ අනුමතිය ලබා ගත යුතු බව දන්නේද;

(ii) ඒ අනුව, වයස අවුරුදු 12 න් පහළ මුස්ලිම් දැරියන් විවාහ කරදීමේදී, ක්වාසි විනිසුරුවරයන් විසින් අවසර ලබා දී තිබෙන බවට වාර්තා වී තිබේද;

(iii) එසේ නම්, වර්ෂ 2010 සිට මේ දක්වා එම පනත අනුව, අනුමතිය ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව සහ ඒ පිළිබඳ විස්තර එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 ජූලි මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1068/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන පණිවුඩකරුවන් ඒකාබද්ධ සේවයට අයත් බවත්;

(ii) පණිවුඩකරුවන් සෘජුව බඳවා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පණිවුඩකරුවන් බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලැබුනු දිනය කවරේද;

(iii) එකී අවසරය ලබා දුන් ලිපියේ පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පණිවුඩකරුවන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරි (පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන්ද;

(ii) එසේ නම්, එකී සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව වනවිටත් එකී නිලධාරියා වැඩ තහනමට ලක්ව සිටි බව පිළිගන්නේද;

(iii) වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකු සේවයේ යෙදී සිටින්නේ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම හා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශ දෙකටම අයත් අක්කර 98 ක වපසරියකින් යුත් බඳුවිල වත්ත ඉඩමේ සංචාරක නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අනුමතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගමේ නම හා ලිපිනය කුමක්ද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශයේ බලවත් පාරිසරික හානියක් සිදුවන බව දන්නේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1186/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය ප්‍රවාහනයේ ප්‍රධාන සංරචකයක් වන ශ්‍රී ලංගම බස් සේවාව, පෞද්ගලික අංශයේ බස් සේවාවට තරඟකාරී සේවාවක් වශයෙන් පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2014.12.31 දිනට මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම බස් ඩිපෝවලට අයත් බස් රථ සංඛ්‍යාව;

(ii) 2016.06.01 දින වනවිට එක් එක් වෘත්තිය අනුව ඉහත එක් එක් ඩිපෝවෙහි සේවක සංඛ්‍යාව;

(iii) 2015.01.01 දිනට පසු මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝ සඳහා ලබා දී ඇති බස් රථ සංඛ්‍යාව;

එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2014, 2015, 2016 යන වර්ෂයන්හි මාතර දිස්ත්‍රික්කයේ,

(i) ශ්‍රී ලංගම බස් ඩිපෝවල වාර්ෂික පිරිවැටුම;

(ii) ශ්‍රී ලංගමය විසින් ආවරණය කරනු ලබන මාර්ග කිලෝ මීටර් ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මගී අවශ්‍යතාවය අනුව, මාතර දිස්ත්‍රික්කය තුළ තවත් කොපමණ බස් ඩිපෝ සංඛ්‍යාවක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන්නේද;

(ii) ඒ සඳහා හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1334/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ග නොකළ කසළ එකතු නොකිරීමට පළාත් පාලන ආයතන ගත් තීරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) කසළ වර්ගීකරණය කර එකතු කිරීමට අවශ්‍ය පහසුකම් ජනතාවට ලබාදී තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(v) වර්ගීකරණය කරන ලද කසළ එකතු කිරීමට පළාත් පාලන ආයතන සඳහා පහසුකම් සලසා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කසළ වර්ගීකරණය කර නොදෙන පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ගීකරණය කරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ස්ථානයකදීද;

(iv) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල කොපමණද;

(v) ප්‍රතිචක්‍රීකරණය කරන ලද කසළ කවර කටයුතු සඳහා භාවිත කළ හැකිද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1404/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 අයවැය යෝජනා අංක 175ට අනුව, අලි මිනිස් ගැටුමට ඉලක්කගත විසඳුමක් ලබාදීම සඳහා වසර 3ක් තුළ ප්‍රයෝජනයට ගැනීමට වෙන් කරන ලද රුපියල් මිලියන 4000ක ප්‍රතිපාදනයෙන් 2016 වර්ෂය තුළ උපයෝජනය කරන ලද මුදල් ප්‍රමාණය සහ එසේ වැය කළ මුදලෙහි ඵලදායීත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන අමාත්‍යාංශය හෝ ආයතන කවරේද;

(ii) 1977 සිට මේ දක්වා අලි මිනිස් ගැටුමෙන් වාර්තා වූ මරණ සංඛ්‍යාව හා දේපළ හානිය එක් එක් වර්ෂය අනුව කවරේද;

(iii) ඉහත එක් එක් වර්ෂයේදී අලි මිනිස් ගැටුමෙන් මියගිය පාර්ශ්වයන්ට රජය මඟින් වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම වන්දි මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කවරේද;

(v) උක්ත අයවැය යෝජනාවෙහි සඳහන් අලි-මිනිස් ගැටුම සඳහා ලබා දීමට අපේක්ෂිත ඉලක්කගත විසඳුම පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1477/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) 2015 වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, මෙම එක් එක් ආයතනය සඳහා බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ බඳවා ගනු ලැබූ පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගනු ලැබූ තනතුරු කවරේද;

(iv) එම සේවකයන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1503/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ළමා ජනගහනයෙන් මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව නිගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව ළමා ජනගහනයෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් දරුවන් සංඛ්‍යාව, සමාජයේ එක් එක් ආදායම් මට්ටම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පහසුවෙන් රෝගවලට භාජනය වීම හේතුවෙන් මියයන බවට වාර්තා වී ඇති මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1679/'17

ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා, — සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) මඩකලපුව ශික්ෂණ රෝහලේ පවත්නා වාට්ටු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් වාට්ටුවේ පවත්නා ඇඳන් සංඛ්‍යාව සහ දැනට ඇතුළත් කරගනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සියලුම විශේෂඥ වෛද්‍යවරුන්ගේ නම් සහ ඔවුන්ගේ අදාළ වෛද්‍ය ක්ෂේත්‍ර කවරේද;

(iv) මෙම විශේෂඥ වෛද්‍යවරුන්ට වාට්ටු පවරාදීම පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශේෂඥ වෛද්‍යවරුන්හට පැවරීම සඳහා වාට්ටු හිඟයක් පවතින බවත්;

(ii) ඉඩකඩ සහ ඇඳන් නොමැතිවීම හේතුවෙන් සාමාන්‍ය රෝගීන් සහ කඩිනම් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යවන බරපතල රෝගාබාධවලින් පෙළෙන රෝගීන් ඇතැම් වාට්ටුවල බිම සහ පිලේ දමා සිටින බවත්;

(iii) අමතර වාට්ටු ඉදිකිරීම සඳහා රෝහල් පරිශ්‍රය තුළ ඉඩකඩ පවතින බවත්;

(iv) මෙය නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය හදාරන සිසුන් සඳහා වෙන්කරන ලද ශික්ෂණ රෝහල බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉතා කඩිනම් අවශ්‍යතාවයක්ව පවතින මෙම වාට්ටු ඉදිකිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවය ලබා දී ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදන නිකුත් කිරීමට නියෝග කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1187/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1335/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 හා 2016 වර්ෂයන්හිදී දකුණු පළාතෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව, දකුණු පළාතේ වැඩිම වකුගඩු රෝගීන් පිරිසක් වාර්තාවන දිස්ත්‍රික්කය කවරේද;

(iii) දකුණු පළාතේ වකුගඩු රෝගයට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම වකුගඩු රෝගීන් වෙනුවෙන් රජය ආධාර ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ලබාදී ඇති ආධාර කවරේද;

(iii) දකුණු පළාතේ වකුගඩු රෝග නිවාරණයට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1406/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 185ට අනුව, නිදහස් Wi-Fi පහසුකම් සැපයූ රාජ්‍ය විශ්වවිද්‍යාල සහ එම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් මෙම පහසුකම් භුක්ති විඳීම ආරම්භ කළ දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහත ඩිජිටල්කරණ පහසුකම් සැපයීම වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු පිරිවැය කොපමණද;

(iii) එම පිරිවැය, වැය බරක් වූ අමාත්‍යාංශය හෝ ආයතනය කවරේද;

(iv) රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉගෙනුම ලබන සියලුම සිසුන්ට ලැප්ටොප් පරිගණක ලබාදීම සම්බන්ධයෙන් රජයට නිශ්චිත වැඩපිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1505/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 වසරේදී,

(i) මූලධන වියදම් සඳහා වෙන්කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(ii) මූලධන වියදම් සඳහා වෙන්කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(iii) පුනරාවර්තන වියදම් සඳහා වෙන්කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(iv) පුනරාවර්තන වියදම් සඳහා වෙන්කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(v) වෙන්කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(vi) වෙන්කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිතා කර ඇති අමාත්‍යාංශය 05 කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/'17

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 වර්ෂයේදී මඩකළපුව කළපුවෙහි වැලිපරය ආසන්නයෙහි මඩ කැණීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ බවත්;

(ii) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමැද දී නවතා දැමූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මුහුද සහ කලපුව සම්බන්ධ කෙරෙන මුවදොර වාර්ෂිකව වසා දැමීමට සිදු නොවීම;

(ii) කලපු ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන් හට මුලු අවුරුද්ද පුරාම ප්‍රතිලාභ ලැබීමට හැකිවීම;

(iii) ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන බෝට්ටුවලට සහ ට්‍රෝලර් යාත්‍රාවන්ට නැංගුරම් ලෑම සඳහා කළපුව වෙත පහසු ප්‍රවේශය;

(iv) ගංවතුර ඉතා ඉක්මනින් මුහුද වෙත ඇදෙන බැවින් ගංවතුර කාලයේදී වී වගාකරන කුඹුරුවලට හානි සිදු නොවීම;

(v) ගංවතුර ඉතා පහසුවෙන් මුහුද වෙත ඇදී යාම නිසා රජය මඟින් සිදුකළ යුතු ගංවතුර සහන කටයුතු අවම වීම;

යන ප්‍රතිලාභයන් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන බවත්, එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය නැවත ඇරඹීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

1336/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රෝහල් සඳහා වර්ෂයකට අවශ්‍ය වන හෘදය වස්තුවෙහි නාල අවහිරතා මඟහැරවීම සඳහා භාවිතා කරනු ලබන "ස්ටෙන්ට්ස්" සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

(iii) ඉදිරියේදී හිඟයකින් තොරව මෙම "ස්ටෙන්ට්ස්" රෝගීන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හදවත් රෝගීන් සඳහා අවශ්‍ය වෙනත් ඖෂධ වර්ග හා උපකරණ රජයෙන් නොමිලේ ලබා දීමට බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 ජූලි මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1069/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යෝජිත කුරුණෑගල - දඹුල්ල දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව චීන සමාගමකට පවරා තිබේද;

(ii) නොඑසේ නම්, පැවරීමට සැලසුම් කර තිබේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයනය මොරටුව විශ්වවිද්‍යාලයට හෝ වෙනත් දේශීය ආයතනයකට භාර නොදීමට හේතු කවරේද;

(iv) ඒ සඳහා ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමක් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1155/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සඳහා CAQ - 1043 හා CAQ - 1047 යන අංක දරන වාහන මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, එම වාහන මිලදී ගත් දින කවරේද;

(iii) එක් එක් වාහනය මිලදී ගත් මුදල කවරේද;

(iv) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) ටෙන්ඩරයට ඉදිරිපත් වූ ආයතන හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(vii) එම වාහනවල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මුල් අයිතිකරුවන් කවුරුන්ද;

(viii) ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

(ix) රේගු වාර්තා අනුව මෙම වාහන ආනයනයේදී CIF වටිනාකම හා ගෙවූ මුදල කවරේද;

(x) එම වාහන සඳහා හිමිවූ බදු සහනය කොපමණද;

යන්න එතුමා දන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1188/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1294/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නෛතික අයිතිය නොමැතිව මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල මේ දක්වා පදිංචිව සිටින හෝ වගා කරමින් සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පුද්ගලයන් සංඛ්‍යාවෙන් කවර සංඛ්‍යාවකට ඔප්පු හෝ බලපත්‍ර ලබා දීමට පියවර ගෙන තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2014 හා 2015 වර්ෂයන්හි මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සඳහා පිරිනමා ඇති ඔප්පු හෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත (v) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1337/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී ඉසෙඩ් ලකුණු එක් එක් විශ්වවිද්‍යාලයට අදාළව නිකුත්කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ඇතැම් සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී ඇති බවත්;

(iii) මෙම ක්‍රමවේදය හේතුවෙන් ඔවුන්ට විශාල අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අසාධාරණයට ලක්වූ සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එය ක්‍රියාත්මකවන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1408/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 182 යෝජනාවට අනුව, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් (Primary Industry Council) පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය සහ ස්ථානය කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවෙහි, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් පිහිටුවීමේ අරමුණු හා ඒ සඳහා වූ වැඩපිළිවෙළ සැකෙවින් පැහැදිලි කරන්නේද;

(iv) මෙම කවුන්සිලයට සම්බන්ධවන විශේෂඥයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) උක්ත යෝජනාවෙහි සඳහන් වන ශ්‍රී ලංකාවේ දැනට සක්‍රීයව පවත්නා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(vi) 2009 යුද ගැටුම් නිමවීමෙන් පසු, උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ අළුතින් ඇරඹූ ප්‍රාථමික කර්මාන්තයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1504/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ මුල් භාගයේදී සහ 2017 වර්ෂයේ මේ වනවිට වෙළඳපොළේ වී වගාව සහ වෙනත් වැවිලි සඳහා භාවිතා කරනු ලබන විවිධ පොහොර වර්ගවල මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2016 වර්ෂය මුල පැවති පොහොර මිල අනුව සැසඳීමේදී, මේ වනවිට පොහොර මිල වැඩිවී ඇති බව පිළිගන්නේද;

(iii) 2016 වර්ෂය මුල වෙළඳපොළේ රු. 1300/- ක් වූ කිලෝ 50ක පොහොර මිටියක මිල මේ වනවිට රු. 2900/- දක්වා වැඩිවී තිබේද;

(iv) පොහොර මිල පාලනය නොකළහොත් හෝ පොහොර සහනය වෙළඳපොළ මිල ගණන් අනුව වැඩි නොකළහොත්, වැවිලි කර්මාන්තය ඇතුළුව කෘෂිකර්මාන්තය මත රඳුණු ජන ජීවිතය විශාල කඩා වැටීමකට ලක් වන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා යෝජනා කරන විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/’17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල නිරත වන බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මරු පහරක් වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් වගා හානි වූ ජනතාවට වන්දි ගෙවීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1734/’17

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරු විදුහල්වල සිට, අවසන් පරීක්ෂණයට සහභාගි නොකරම වන්නි දිස්ත්‍රික්කයට පත් කරන ලද ගුරු පුහුණුලාභීන් 41 දෙනෙකු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් 2016.12.02 වන දින අසනු ලැබූ බවත්;

(ii) මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නැවතත් පිළිතුරක් ලබාදෙන බවට රාජ්‍ය අමාත්‍යවරයා සහතික වුවද මෙම ගැටළුව තවමත් විසඳා නොමැති බවත්;

(iii) ගුරු පුහුණුව අවසන් වූ වහාම අදාළ අවසන් පරීක්ෂණය පැවැත්වීමට අමාත්‍යාංශය විසින් කටයුතු නොකළ හෙයින්, මෙම ගුරුවරුන්ට එම අවසන් පරීක්ෂණයට සහභාගී වීමට නොහැකි වූ බවත්;

(iv) තමන්ට වඩා කණිෂ්ඨ පුහුණුලාභීන් කණ්ඩායමක් සමඟ අවසන් පරීක්ෂණයට පෙනී සිටි මෙම ගුරුවරුන්ගේ පත්වීම් ක්‍රියාත්මකවන දිනය වශයෙන් වෙනත් දිනයක් ලබාදීම ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුරුවරුන් 41 දෙනාගේ පත්වීම් ක්‍රියාත්මක දිනය වශයෙන් එකම දිනයක් ලබාදෙන්නේද;

(ii) පුහුණු ගුරුවරුන් බවට පත්වීමට පෙර, ගුරු විද්‍යාලවල පුහුණුව ලබන අතරේ ඔවුන්ට 'ගුරු පුහුණුලාභියා' (Teacher Trainee) යන පදය භාවිතා කිරීම වැරදි නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1189/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට අම්පාර දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1352/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු කොරියාවේ රැකියා සඳහා යන ශ්‍රී ලාංකීය තරුණ තරුණියන් විශාල විදේශ විනිමයක් මෙරටට ගෙන එන බවත්;

(ii) ඔවුන් මෙම මුදල් නිසි ලෙස කළමනාකරණය කර ආයෝජන නොකරන බවත්;

(iii) එහෙයින් මෙරටට පැමිණ ටික කාලයකින් ඉපැයූ මුදල් අවසන්වීම නිසා අසරණ තත්ත්වයට පත්වන බවත්;

එතුමිය දන්නෙහිද ?

(ආ) (i) මුදල් කළමනාකරණය හා ආයෝජනය පිළිබඳව මෙම පිරිස දැනුවත් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) මෙම පිරිස මෙරටට ගෙන එන මුදල් ආයෝජනය කිරීමට අවශ්‍ය පහසුකම් සැකසීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(v) උක්ත පිරිස සම්බන්ධව පසුවිපරම් සිදු කිරීමට රජය මගින් යාන්ත්‍රණයක් ඇති කරන්නේද;

(vi) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1409/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 181ට අනුව, රත්‍රන් ආනයනය සඳහා බලපත්‍ර 50ක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් විසින් ගෙවූ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා ලෝක වෙළඳපොළෙහි රත්‍රන් මිල හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) බදු රහිතව ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන තැනැත්තන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාව රත්‍රන් ආනයනය කරනු ලබන ප්‍රධාන සැපයුම්කරුවන් සහ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1508/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කවරේද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වී තිබේද;

(iii) 2016 වර්ෂය තුළදී ශුද්ධ විදේශීය මිලදී ගැනීම්වල අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1190/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබාදීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1353/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩවත - මහනුවර අධිවේගී මාර්ගයේ දුර කොපමණද;

(ii) ඒ සඳහා වැය වන මුදල කොපමණද;

(iii) ඉදිකිරීම් කටයුතු සිදු කරන සමාගම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත මාර්ගය ඉදිකිරීමේදී අදාළ ප්‍රදේශයන්හි පරිසර පද්ධතීන්ට සිදු විය හැකි හානිය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම හානි අවම කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) මාර්ගයේ වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?